සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| නැටුම් (භරත) I<br>நாட்டியம் (பரதம்) I<br>Dancing (Baratha) I | 53 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** 'හරි තිරුමරුගන්' යන ගීත ඛණ්ඩයෙන් සඳහන් කෙරෙනුයේ,
(1) බ්‍රහ්මා ය. (2) විනායගර් ය. (3) මුරුගන් ය.
(4) සිවන් ය. (5) කුබේරන් ය.

**2.** භරත නැටුම් උරුප්පඩිවල දක්නට ඇති තීර්මාණංගල් මෙන් කුත්තුවල දක්නට ලැබෙන්නේ,
(1) සොට්කට්ටු ය. (2) ජති ය. (3) කෝර්වයි ය.
(4) අරුති ය. (5) තරු ය.

**3.** ; ; ; ; ; , තකතදිංගි/ණතොම් තකතදිංගිණ/තොම් තකතදිංගිණතොම්//
ඉහත තාලාංගයේ පිහිටිය හැකි තදිංගිණතොම් අඩව්වේ ජාති
(1) තිස්රම් ය. (2) සතුස්රම් ය. (3) කණ්ඩම් ය.
(4) මිස්රම් ය. (5) සංකීර්ණම් ය.

**4.** දෙකකට හෝ එයට වැඩි කරණංගලින් කෝවයි හඳුන්වන්නේ කෙසේ ද?
(1) අංගකාරංගල් (2) කුට්ටිකරණම් (3) ස්ථානම්
(4) සාරි (5) නිරුත්තහස්තම්

**5.** ගීතය, වාද්‍යය, නිරුත්තියම් යනාදිය හඳුන්වන්නේ කෙසේ ද?
(1) තෞරියද් තිරිභම් (2) මූවිසයි (3) තිරිකඩුකම්
(4) තිරිපුරම් (5) තිරිවේණි

**6.** ඉන්ද්‍රයා අභිනයෙන් පෙන්වීමට සුදුසු පාදභේදම කුමක් ද?
(1) අයින්ද්‍රම් (2) ස්වස්තිගම් (3) මෝඩිතම්
(4) ඒකපාදම් (5) සමපාදම්

**7.** පද වර්ණවලින් උත්තරාංග කොටසෙහි ඇතුළත් වනුයේ,
(1) පල්ලවි, සරණම් ය. (2) අනුපල්ලවි, සරණම් ය.
(3) සරණම්, සරණස්වරම් ය. (4) මුක්තායිස්වරම්, සරණම් ය.
(5) අනුපල්ලවි, මුක්තායිස්වරම් ය.

**8.** 'අෂ්ඨපති' නම් භරත නාට්‍ය උරුප්පඩියෙහි පරමාත්මා
(1) විෂ්ණු ය. (2) බ්‍රහ්මා ය. (3) සිවන් ය.
(4) ගණපති ය. (5) මුරුගන් ය.

**9.** ලෝක නර්තන දිනය සැමරෙන්නේ,
(1) ජනවාරි 01 දා ය. (2) පෙබරවාරි 14 දා ය. (3) මාර්තු 30 දා ය.
(4) අප්‍රේල් 29 දා ය. (5) ජුනි 30 දා ය.

**10.** භරත ශාස්ත්‍රයේ හයවන පරිච්ඡේදයෙන් කියැවෙන්නේ පහත සඳහන් කවරක් ගැන ද?
(1) වේදිකා සැකැස්ම ගැන ය. (2) නර්තනයේ ප්‍රයෝජන ගැන ය. (3) කරණම් ගැන ය.
(4) නර්තනය බිහි වීම ගැන ය. (5) රස ගැන ය.

[ දෙවැනි පිටුව බලන්න.

**11.** සංගීත මිනුම් දණ්ඩ ලෙස සඳහන් වන වාද්‍ය භාණ්ඩය
(1) බටනළාව ය. (2) මිරුතංගම් ය. (3) වයලීන් ය. (4) යාල් ය. (5) වීණාව ය.

**12.** සබරගමු නර්තන සම්ප්‍රදායේ ගැමි ගී පදනමින් බිහිවූයේ,
(1) මුල් මාත්‍රය ය. (2) සින්දු මාත්‍රය ය. (3) පටුදැල් මාත්‍රය ය.
(4) යක්පද මාත්‍රය ය. (5) යාදිනි මාත්‍රය ය.

**13.** තිරුක්කුට්ට්‍රාල කුරවංජියෙහි තිරිකූඩනාදර් පැදකුණු කරන අවස්ථාවේ ඔහු දැක පෙමින් බැඳෙන නායිකාව
(1) වල්ලි ය. (2) වසන්ත වල්ලි ය. (3) රාදයි ය.
(4) රති ය. (5) සීතා ය.

**14.** මරාටි රජසමයේ 'සංගීත මහල්' යනුවෙන් හඳුන්වනු ලැබුවේ,
(1) නාට්‍ය ශාලා (නාට්ටිය සාලෛ) ය. (2) ශාලාව (මණ්ඩබම්) ය.
(3) රංග ශාලාව (අරංගු) ය. (4) කලරිය ය.
(5) වේදිකාව (මේඩයි) ය.

**15.** ස්රෝතෝවක යදිය හඳුන්වන වෙනත් නමක් වන්නේ,
(1) පර්වත යදි ය. (2) ඩමරුක යදි ය. (3) මිරුතංග යදි ය.
(4) සම යදි ය. (5) විෂම යදි ය.

**16.** කුච්චිපුඩි නර්තනයේ වර්තමාන ආකාරය සකස් කළේ,
(1) සිත්තේන්ද්‍ර යෝගි ය. (2) තදේ පල්ලි පේරෙයා ශාස්ත්‍රි ය.
(3) වේම්බටි සින්න සත්යම් ය. (4) වේදාන්තම් ලක්ෂ්මි නාරායන ශාස්ත්‍රි ය.
(5) හරි මාදවයියා ය.

**17.** සිලප්පදිගාරම්හි පොදු කරුණු හා බැඳුණු රංගනවලින් එකක් ලෙස සැලකෙනුයේ,
(1) පාණ්ඩුරංගම් ය. (2) කොඩුකොට්ටි ය. (3) ආච්චියර්කුරවයි ය.
(4) පේඩික් කූත්තු ය. (5) කුඩක්කූත්තු ය.

**18.** ඛණ්ඩජාති අඩතාලම් මිශ්‍ර කදි සමග එකතු වන විට ලැබෙන තාලම ගන්නා අක්ෂරවල සංඛ්‍යාව,
(1) 90 කි. (2) 98 කි. (3) 108 කි. (4) 126 කි. (5) 162 කි.

**19.** මුක වීණාව යනු,
(1) තත් භාණ්ඩයකි. (2) සම්භාණ්ඩයකි.
(3) ලෝහමය භාණ්ඩයකි. (4) සිදුරු භාණ්ඩයකි.
(5) තාල භාණ්ඩයකි.

**20.** කතකලි නර්තනයේ වේෂ නිරූපක කලාකරුවා හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
(1) කට්ටියක්කාරන් (2) සෞට්ටික්කාරන් (3) අන්නාවියාර්
(4) නට්ටුවනාර් (5) පක්කප්පාට්ටුක්කාරර්

**21.** 'ශාන්ති නිකේතනය' නම් කලාගාරය ස්ථාපිත කළේ,
(1) ඊ. ක්‍රිෂ්ණයියර් ය. (2) රබීන්ද්‍රනාත් තාගෝර් ය. (3) කාලිදාසර් ය.
(4) තංජයි පොන්නයියා පිල්ලයි ය. (5) ගෞරි අම්මාල් ය.

**22.** වේදිකාව මත රඟුමෙහි යෙදෙන අයගේ සිතේ සතුට හඟවන අවස්ථාවක යොදා ගන්නා ආලෝකය
(1) පරප්පොළි (පැතිරුණු ආලෝකය) ය. (2) කීට්ටෑ ඔළි (ආලෝක කදම්භය) ය.
(3) මංගලාන ඔළි (මන්දාලෝකය) ය. (4) කුවින්ද ඔළි (නාභිගත ආලෝකය) ය.
(5) ප්‍රගාසමාන ඔළි (දීප්තිමත් ආලෝකය) ය.

**23.** සුළු වේදනාවක් හෝ නොමැති සිතේ ක්‍රියාව හඟවන විරුත්තිය/විරුත්ති
(1) ආරපඩි විරුත්තියයි. (2) සාද්වති විරුත්තියයි.
(3) භාරති විරුත්තියයි. (4) කයිසිගි විරුත්තියයි.
(5) ආරපඩි විරුත්ති සහ භාරති විරුත්තියයි.

**24.** සිලප්පදිගාරම්හි රංගශාලාවේ තිරය හඳුන්වන වචනය,
(1) අරංගු ය. (2) තට්ටි ය. (3) සේලයි ය.
(4) එළිනි ය. (5) කාට්චිත් තිරය ය.

**25.** "සරිග කොංගු ............" යන ජාවලි පිහිටි රාගය
(1) මෝහනම් ය. (2) කානඩා ය. (3) කල්යානි ය. (4) සුරුට්ටි ය. (5) ආරබි ය.

[ තුන්වැනි පිටුව බලන්න.

**26.** "වාරණම් ආයිරම් සූල" යන ගීතයේ වාරණම් යනු,
(1) මොනරා ය. (2) අලියා ය. (3) මීහරක් ය. (4) හංසයා ය. (5) කොවුලා ය.

**27.** ත්‍යාගරාජ ස්වාමිගේ පංචරත්න කීර්තනවලට නැටුම් සංවිධානය කර ප්‍රසිද්ධියට පත්වූයේ,
(1) වලුවූර් රාමයියා පිල්ලයි ය. (2) අභිනය රජිනි බාලසරස්වතී ය.
(3) කලයිමාමනි රුක්මණි අරුණ්ඩේල් ය. (4) බන්දනයි නල්ලූර් මීනාට්සි සුන්දරම් පිල්ලයි ය.
(5) ගංගයි මුත්තු නට්ටුවනාර් ය.

**28.** රාජ්‍ය සභාවල නැටූ අයට 'පාහර්, කාවන්යර්' යැයි හැඳින්වූ නර්තන සම්ප්‍රදාය වනුයේ,
(1) මෝහිනි ආට්ටම් ය. (2) මනිපුරි ය. (3) ඔඩිසි ය.
(4) කතක් ය. (5) කතකලි ය.

**29.** "නල්ල සහුනම් නෝක්කි සොල්ලඩි" යන පද්‍යයේ සාහිත්‍ය කර්තෘ
(1) මහා කවි සුබ්‍රමනිය පාරදියාර් ය. (2) ඉයලිසයිවාරිදි වීරමණි අයියර් ය.
(3) කවි මුරුගයියන් ය. (4) කවිප් පේරරසු වෛරමුත්තු ය.
(5) කවිමණි තේසිග විනායගම් පිල්ලයි ය.

**30.** 'කන්දුක නිරුත්තම්' දක්නට ලැබෙන රංගන වර්ගය,
(1) භරත නාට්‍ය වේ. (2) මනිපුරි වේ.
(3) මෝහිණි ආට්ටම් වේ. (4) ඔඩිසි වේ.
(5) කුච්චිපුඩි වේ.

**31.** රාමනාදන් ලලිත කලා සංගමය විවෘත කළේ,
(1) ටී. එම්. නාරායන ස්වාමි පිල්ලයි මහතා ය.
(2) සංගීත කලාවේදී මහාරාජපුරම් විශ්වනාද අයියර් ය.
(3) මහාචාර්ය පී. සාම්බමූර්ති ය.
(4) මහාරාජපුරම් වී. සන්දානම් මහතා ය.
(5) මහාචාර්ය සන්ධ්‍යාවන්දනම් සීනිවාස අයියර් ය.

**32.** පැරණි දෙමළ සාහිත්‍යවල දක්වන අභ්‍යන්තර තේරුම් විස්තර අඩංගු උරුප්පුඩි වනුයේ,
(1) කීර්තණයි ය. (2) පදම් ය. (3) තිල්ලානා ය.
(4) අලාරිප්පු ය. (5) පුෂ්පාංජලී ය.

**33.** කලාවලට හා ශාස්ත්‍රවලට උනන්දුවක් දක්වූ නායකයා,
(1) ශ්‍රී රාම ය. (2) රාවණා ය. (3) ශ්‍රී ක්‍රිෂ්ණා ය.
(4) බුදුරජාණන් වහන්සේ ය. (5) දුර්යෝදනන් ය.

**34.** 'තෝයුම් තිදි අමයිප්පිල් ......' යන සත්‍ය පහදා දීමේ සඳහන් නඩරාජා පෙරුමාන්ගේ ශ්‍රී දේහය,
(1) ඔසවාගත් ශ්‍රී පාදයයි. (2) ඔබා ඇති ශ්‍රී පාදයයි. (3) වම් වරද හස්තයයි.
(4) උඩැක්කිය ඔසවාගත් හස්තයයි. (5) දකුණු අභය හස්තයයි.

**35.** දේව ප්‍රශංසාව කවි සොට්කට්ටුවල පිහිටුවා අභිනයෙන් කරන නර්තන උරුප්පඩිය වනුයේ,
(1) අලාරිප්පු ය. (2) ජතිස්වරම් ය. (3) ශවුත්තුවම් ය.
(4) ජාවලි ය. (5) තිල්ලානා ය.

**36.** දේවාල වන්දනාවේ 'ශෝඩශෝපසාරම්' යනුවෙන් පවසන නැමදුම් ක්‍රමයේ 14 වන අංගය,
(1) ගීත වාදනය වේ. (2) දීපාරාධනය වේ. (3) නිරුත්තියම් වේ.
(4) පණිසයි වේ. (5) වේද උච්චාඩනම් වේ.

**37.** රඟ දක්වන්නා ගීතය තමා ම ගායනය කරමින් අභිනයෙන් කිරීම,
(1) උපශබ්ද වාචිචිකම් ය. (2) උපගීත වාචිචිකම් ය. (3) සුබිත වාචිචිකම් ය.
(4) සුශබ්ද වාචිචිකම් ය. (5) ගීත වාචිචිකම් ය.

**38.** සෞඛකාලයේ පිහිටන උරුප්පඩි වනුයේ,
(1) අලාරිප්පු හා ශබ්දම් ය. (2) ශවුත්තුවම් හා තිල්ලානා ය.
(3) පදම් හා කීර්තණම් ය. (4) වර්ණම් හා ජතිස්වරම් ය.
(5) අලාරිප්පු හා ජතිස්වරම් ය.

**39.** චතුර්විධ අභිනයවල 'ආංගිහම්' යන්නෙහි තේරුම ගෙන දෙන වෙනත් වචනයක් නම්,
(1) තන්ජායි වේ. (2) අනුසායි වේ. (3) විපසායි වේ.
(4) අභිනය වේ. (5) සායි වේ.

[ හතරවැනි පිටුව බලන්න.

**40.** උඩැක්කි වාදනයේ දී රෙදිකඩ ලිහිල්ව හා තදව අල්ලන්නේ,
(1) අලංකාරය වැඩි කිරීමට ය. (2) නොවැටී තබා ගැනීමට ය.
(3) තාලයේ වෙනස දැක්වීමට ය. (4) උස් හඬ හා පහත් හඬ ඇති වීමට ය.
(5) උඩැක්කියේ ඇති සිදුරු වැසීමට ය.

**41.** තියාන ස්ලෝහය වන "ආංගිහම් පුවනම් .......". යනුවෙන් ආරම්භ වන ග්‍රන්ථය,
(1) අභිනය තර්පණම් ය. (2) නඩන කලෙයි (නර්තන කලාව) ය.
(3) නාට්‍ය කලෙයි (නැටුම් කලාව) ය. (4) අභිනය සාරසම්පුඩම් ය.
(5) භරත කලාව ය.

**42.** දානපතියකුට උදාහරණයක් වශයෙන් සැලකිය හැක්කේ,
(1) මහේන්ද්‍ර වර්මන් ය. (2) අර්ච්චුනන් ය. (3) සිපිචක්‍රවර්ති ය.
(4) දසරත ය. (5) කර්ණන් ය.

**43.** රංගන කලාවේ දී කාන්තාවන් හැඳින්වීමට යොදන හස්තම්
(1) ඩෝලම් වේ. (2) ස්වස්තිකම් වේ.
(3) කඩකා වර්තනම් වේ. (4) අවකිත්තම් වේ.
(5) කීලකම් වේ.

**44.** විඥානය අවදි වීමට සෞන්දර්ය අධ්‍යාපනය එක් කොන්දේසියක් වන බව පැවසුවේ,
(1) රූසෝ ය. (2) ලෙනින් ය.
(3) මහත්මා ගාන්ධි ය. (4) කාර්ල් මාක්ස් ය.
(5) ශේක්ස්පියර් ය.

**45.** 'පිණ්ඩි' යනු,
(1) අභිනයන ක්‍රියාවයි. (2) ද්විත්ව හස්ත ක්‍රියාවයි. (3) එලිට්කයි ක්‍රියාවයි.
(4) තොලිට්කයි ක්‍රියාවයි. (5) ඒක හස්ත ක්‍රියාවයි.

**46.** නර්තනයට 'කූනිප්පු' යැයි හැඳින්වූ සාහිත්‍ය යුගය,
(1) සංග යුගයයි. (2) සංගම් මරුවිය යුගයයි.
(3) චෝළ යුගයයි. (4) පල්ලව යුගයයි.
(5) නායක්කර් යුගයයි.

**47.** අශෝක වනයේ රඳවා සිටි සීතා හනුමන් දුටු විට සීතාට ඇති වූ රසයන් වනුයේ,
(1) භය හා ආශ්චර්ය රසයයි. (2) හාස්‍ය හා වීර රසයයි.
(3) ශාන්ත හා වීර රසයයි. (4) බීභත්ස්‍ය හා ආශ්චර්ය රසයයි.
(5) කරුණාව හා වීර රසයයි.

**48.** කුරවයි කුත්තාඩුම් වේලන් හිසේ පැළඳ සිටි මල
(1) මුල්ලයි ය. (2) මරුක්කොලුන්දු ය. (3) කණ්ණි ය.
(4) සාමන්දි ය. (5) රෝස ය.

**49.** "තයියලේ උනයි නිනයින්දු නිනයින්දුරුගි තයංගුගිරාර් අඩිමානේ ......" මෙය කවරකු විසින් කාට කියන ලද්දක් ද?
(1) නායකයා - නායිකාවට (2) නායිකාව - මිතුරියට
(3) මිතුරිය - නායිකාවට (4) නායිකාව - නායකයාට
(5) හැදූ මව - නායිකාවට

**50.** "ඒරුමයිල් ඒරි විලයාඩු මුහමොන්රේ" යැයි තිරුප්පුහල්හි සඳහන් වනුයේ,
(1) අරුමුගන් දාර්ශනික කතාව ය. (2) හෙල්ලෙහි අභ්‍යන්තර අදහස ය.
(3) සැවුල් කොඩියේ අදහස ය. (4) මොනර වාහනයේ සුවිශේෂත්වය ය.
(5) මුරුග දෙවියන්ගේ වීරත්වය ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| නැටුම් (භරත) II<br>நாட்டியம் (பரதம்) II<br>Dancing (Baratha) II | 53 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

**උපදෙස්:**
※ **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඔබ උගත් පද වර්ණයක රාගය, තාලය ආදිය ද එම පද වර්ණයේ දැක්වෙන කතා නායකයා හා කතා නායිකාව ද ලියන්න. (ලකුණු 04යි.)
(ii) එම පද වර්ණයේ පල්ලවි කොටසට අයත් තීර්මාණයක් තාල අංග සලකුණු සමග ලියන්න. (ලකුණු 08යි.)
(iii) එම පද වර්ණයේ තේරුම ලියන්න. (ලකුණු 08යි.)

**2.** ඔඩිසි නර්තනය පහත කරුණු පදනම් කරගෙන පැහැදිලි කරන්න.
(i) ප්‍රභවය (ලකුණු 03යි.)
(ii) වර්ධනය (ලකුණු 03යි.)
(iii) නර්තන ක්‍රමය (ලකුණු 06යි.)
(iv) භාවිත වන සංගීත භාණ්ඩ (ලකුණු 02යි.)
(v) ඇඳුම්, පැළඳුම් හා වේෂ නිරූපණය (ලකුණු 06යි.)

**3.** (i) අෂ්ටවිධ නායිකාවන් සඳහන් කරන්න. (ලකුණු 08යි.)
(ii) අෂ්ටවිධ නායිකාවන්ගේ ගතිලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

## II කොටස

**4.** (i) දේවාලවල ශාස්ත්‍රීය නැටුම් හා ගැමි නැටුම් සිදු කෙරෙන්නේ කුමන අවස්ථාවල දී ද? (ලකුණු 06යි.)
(ii) දේවාලවල මෙම නර්තන වර්ග දෙක සිදු කිරීමේ අරමුණු උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 14යි.)

**5.** කෙටි සටහන් ලියන්න.
(i) සොකරි
(ii) නට්ටුවාංගම්
(iii) නිරුත්තියම්
(iv) ඔළි විදානිප්පු (රංගාලෝක) (ලකුණු 05 × 4 = 20යි.)

**6.** වලුවූර් රාමයියා පිල්ලයි මහතාගේ ජීවිත කතාව හා ඔහුගෙන් නර්තන කලාවට සිදු වූ සේවාව ගැන ලියන්න. (ලකුණු 20යි.)

**7.** (i) ස්වාමි විපුලානන්දා සෞන්දර්ය අධ්‍යාපන ආයතනය පිළිබඳ ව පහත සඳහන් කරුණු යටතේ පැහැදිලි කරන්න.
(අ) බිහි වීම
(ආ) වර්ධනය (ලකුණු 08යි.)
(ii) මෙම ආයතනය භරත නාට්‍ය කලා වර්ධනයට දායක වන ආකාරය විස්තරාත්මක ව විමසන්න. (ලකුණු 12යි.)

**8.** "භරත කලාව ඉගෙනුම තුළින් සෞන්දර්යාත්මක හැඟීම්, ආගමික, සංස්කෘතික අගයන් හා යහපත් ගති ගුණ සංවර්ධනය කෙරේ" මෙම ප්‍රකාශයේ අදාළත්වය විමසන්න. (ලකුණු 20යි.)

※※※